උතුරු මැද පළාත් සභාව - 2015
------------------------------------
උතුරු මැද පළාත් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙහි ඇතුලත් විගණන නිරීක්ෂණ පිළිබඳ විස්තරාත්මක වාර්තාව පළාත් සභාවේ සභාගත කිරීම සඳහා යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.
------------------------------------------------------------------
මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
-----------------------
මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

--------------------------------------------

#### 2.2.1 පළාත් සභා අරමුදල

-------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සභා අරමුදලට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 04 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

#### 2.2.2 අනෙකුත් ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂයට අදාලව 2016 අප්‍රේල් 30 දිනවන විට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | 2015 වර්ෂයට අදාලව | | | ඉකුත් වර්ෂවලට අදාලව |
|---|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i) | විසර්ජන ගිණුම් | 30 | 30 | - | - |
| (ii) | ආදායම් ගිණුම් | 21 | 21 | - | - |
| (iii) | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 33 | 33 | - | - |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 07 | 07 | - | - |
| (v) | අරමුදල් ගිණුම් | 05 | 02 | 03 | 16 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 05 | 05 | - | - |
| | | 101 | 98 | 03 | 16 |

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී කල්බදු පදනම මත තීරුබදු රහිතව මිලට ගෙන තිබුණු රු.216,019,620 ක් වූ වාහන 73 ක පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල රු.509,305,000 ක් ලෙස දක්වා තිබීම නිසා රු.293,285,380 කින් මෝටර් වාහනවල වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) තීරුබදු රහිත වාහන මිලට ගැනීම මත සමාලෝචිත වර්ෂයේ බදු ප්‍රදාන ලෙස හඳුනාගෙන තිබුණු රු.293,564,341 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර කල්බදු ගෙවීම් වාරිකවලට අනුරූපීව ගණනය කරන ලද රු.43,584,389 ක මුදල ආදායම් ලෙස මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ දක්වා ඉතිරි රු.249,979,952 ක වටිනාකම පෙර වර්ෂයට අදාල ආදායමක් ලෙස ගලපා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අත්තිකාරම් ගිණුම් ශේෂයන්, අග්‍රිම ගිණුම් ශේෂයන්, තැන්පත් ගිණුම් ශේෂයන් සහ ණයගැති ශේෂයන් ඇතුළු වෙනත් අක්‍රීය ගිණුම් ශේෂයන් පොත් වලින් ඉවත් කිරීමේදී හඳුනාගෙන තිබුණු රු.726,282 ක ලාභය සහ රු.917,685 ක පාඩුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයෙහි නොගලපා එය 2015 ජනවාරි 01 දිනට වූ පළාත් සභා අරමුදලේ ආරම්භක ශේෂයට ගලපා තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.191,403 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාව අනුව ස්ථාවර වත්කම් වර්ග 06 කට අදාල රු.2,683,284,048 ක් වූ ශේෂයන්ට සමාලෝචිත වර්ෂයේදී අත්පත් කරගත් වත්කම්වල රු.999,221,381 ක් වූ වටිනාකම් එකතු කිරීමෙන් පසු සමාලෝචිත වර්ෂය අවසානයට එකී වත්කම්වල වටිනාකම රු.3,682,505,429 ක් විය යුතු නමුත් එම අගය රු.4,313,542,132 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාවේ දක්වා තිබුණි. එකී වටිනාකම් අතර වූ රු.631,036,703 ක වෙනස, 2015 වර්ෂයට පෙර මිලට ගෙන ඇති නමුත් 2015 වර්ෂයේදී හඳුනාගත් වත්කම්වල වටිනාකම ලෙස ගැලපීම් කර තිබුණි. එසේ වුවත් උක්ත ස්ථාවර වත්කම් වර්ග 06 න් 2015 වර්ෂයට පෙර මිලට ගෙන ඇති නමුත් 2015 වර්ෂයේදී හඳුනාගත් වාහන සහ වෙනත් මූලධන වත්කම්වල වටිනාකම රු.113,573,799 ක් අඩුවෙන් සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුම්වල දක්වා තිබීම නිසා පෙර වර්ෂවලට අදාල නමුත් සමාලෝචිත වර්ෂයේදී හඳුනාගත් වත්කම්වල වටිනාකම එකී ප්‍රමාණයෙන් අඩුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාවේ දක්වා තිබුණි.

2.2.4 නොසැසඳුණු පාලන ගිණුම්

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාවේ සටහන 15 අනුව රු.104,995,161 ක් වූ ප්‍රධාන ලේකම් කාර්යාලයේ සහ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 03 කට අදාල ශේෂයන්හි එකතුව එකී ආයතනවල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් ශේෂය අනුව රු.84,842,446 ක් වීමෙන් ගිණුම් 02 ක රු.25,386,431 ක සෘණ අගයකින් සහ අනෙක් ගිණුමේ රු.4,835,832 ක ධන අගයකින් වෙනස්වීම් සිදුවී තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාවේ සටහන 16 අනුව, පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු 02 කට අදාල රු.31,380,298 ක් වූ ශේෂයන්හි එකතුව, එකී දෙපාර්තමේන්තුවේ පොත්වල වාණිජ අත්තිකාරම් පාලන ගිණුම් අනුව රු.18,310,298 ක් වීමෙන් රු.13,070,000 ක නොසැසඳුණු වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාවේ සටහන 16 අනුව ආයතන 06 ක තැන්පතු ගිණුම්වල රු.102,744,118 ක් වූ ශේෂයන්හි එකතුව විසර්ජන ගිණුමේ සටහන (iii) හි වූ අත්තිකාරම් ගිණුම් හා තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය අනුව රු.107,095,765 ක් වීමෙන් තැන්පතු ගිණුම් 03 ක රු.6,157,569 ක ධන අගයකින් හා අනෙක් ගිණුම් 03 හි රු.1,805,922 ක ඍණ අගයකින් වෙනස්වීම් සිදුවී තිබුණි.

(ඈ) පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුමේ සටහන (v) හි වූ අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,349,628 ක් වූ නිරවුල් නොකල අග්‍රිම හර ශේෂය මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාවේ සටහන 14(ආ) අනුව රු.1,007,628 ක් වීමෙන් රු.342,000 ක නොසැසඳුණු වෙනසක් විය.

(ඉ) මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාවේ 01 හා 02 උපලේඛන අනුව රු.345,990,548 ක් වූ පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 08 කට අදාල බැරකම් වටිනාකම එකී ආයතනයන්හි විසර්ජන ගිණුම්වල ඩී.ජී.එස්.ඒ.-8 ආකෘතීන් අනුව රු.244,192,834 ක් වීමෙන් ආයතන 05 ක රු.203,180,430 ක ධන අගයකින් සහ ඉතිරි ආයතන 03 හි රු.101,382,716 ක ඍණ අගයකින් වෙනස්වීම් සිදුවී තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාව සමඟ වූ 06 හා 07 උපලේඛන අනුව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාල රු.10,060,650 ක් වූ ජංගම නොවන වත්කම්වල වටිනාකම එකී ආයතනයන්හි විසර්ජන ගිණුම්වල ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාව අනුව රු.11,439,294 ක් වීමෙන් රු.1,378,644 ක නොසැසඳුණු වෙනසක් නිරීක්ෂණය විය.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

---------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

--------------------------------------

පළාත් සභාවේ පහත සඳහන් ආයතන 04 වෙත සමාලෝචිත වර්ෂයට අදාලව නිකුත් කරන ලද විගණන විමසුම් 20 කට සහ ඉකුත් වර්ෂවලට අදාලව නිකුත් කරන ලද විගණන විමසුම් 16 කට 2016 අගෝස්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණන විමසුම්වලට අදාලව ගණනය කල හැකි ගනුදෙනුවල වටිනාකම රු.939,553,497 ක් වූ අතර ඉකුත් වර්ෂයට අදාල විගණන විමසුම්වල ගණනය කල හැකි ගනුදෙනුවල වටිනාකම රු.39,876,268 ක් විය.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | සමාලෝචිත වර්ෂය | | ඉකුත් වර්ෂය | |
|---|---|---|---|---|
| | විමසුම් ගණන | ගණනය කල හැකි ගනු දෙනුවල වටිනාකම | විමසුම් ගණන | ගණනය කල හැකි ගනු දෙනුවල වටිනාකම |
| | | රු. | | රු. |
| පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 08 | 29,448,780 | 03 | 99,514 |
| පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 09 | 328,499,329 | - | - |
| ප්‍රධාන අමාත්‍යාංශය | 06 | 363,725,313 | 06 | 39,776,754 |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | 02 | 217,880,075 | - | - |
| එකතුව | 25 | 939,553,497 | 09 | 39,876,268 |

(ආ) පොත් පත් හා ලේඛන නොපැවැත්වීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) කැබිතිගොල්ලෑව මූලික රෝහලේ ඖෂධ ගබඩාවට 2015 වර්ෂයේ අවස්ථා 12 කදී ලැබී තිබුණු වටිනාකම රු.11,222,599 ක් වූ ඖෂධ තොග 2016 මාර්තු 01 දින වනවිටද තොග ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි.

(ii) පළාත් සභාවේ ආයතන 03 ක් විසින් සමාලෝචිත වර්ෂයේදී මිලට ගෙන තිබුණු රු.1,440,616,408 ක් වූ වත්කම්වල තොරතුරු ඇතුලත් කර වත්කම් කළමනාකරණ මෘදුකාංගය යාවත්කාලීන කර නොතිබුණි.

(ඇ) තොරතුරු ඉදිරිපත් නොකිරීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i). සමාලෝචිත වර්ෂයේදී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දෙවන සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පවත්වන ලද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් රු.4,848,931 ක මුදලක් වැයකර තිබුණු අතර, ඒ සඳහා අනුමත වැඩසටහන් විස්තරයක්, වැඩ සටහන් කාල රාමුව, සහභාගීවන සම්පත්දායකයන් හා ඔවුන්ගේ දේශනයන්හි සංක්ෂිප්තයන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ii). පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් රාජකාරි ඉටු කරන නිලධාරීන් වෙත දිරි දීමනා ලෙස 2015 වර්ෂයේදී රු.2,780,142 ක් ගෙවා තිබුණු නමුත් ඒ වෙනුවෙන් දිරි දීමනා යෝජනා ක්‍රමයක් අනුමත කර ගෙන නොතිබුණි.

(iii). උතුරු මැද පළාත් සභාවට අදාල සියළුම ගිවිසුම් පිටපත්, පළාත් අමාත්‍ය මණ්ඩල තීරණ, ලේකම් කමිටු තීරණ, ව්‍යවස්ථාපිත ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල තීරණ, නිලධාරීන්ගේ වැඩ තහනම් කිරීමේ ලිපි, නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීමේ ලිපි සහ නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේ ලිපි යනාදිය ඇතුළු වැදගත් ලිපි,ලේඛන සහ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම උතුරු මැද පළාත් සභාවේ සියළු ආයතන විසින් සිදුකර නොතිබුණි. ඒ අනුව පළාත් සභාවේ ආයතන 03 ක් විසින් 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු ගිවිසුම්ගත වටිනාකම රු.960,918,658 ක් වූ කොන්ත්‍රාත් ව්‍යාපෘති 455 කට අදාල ගිවිසුම් පිටපත් එකී ගිවිසුම්වලට එළැඹෙන අවස්ථාවේදීම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ මත තහවුරු විය. එම නිසා එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අවස්ථාවේදීම පරීක්ෂා කිරීමේ අවස්ථාව විගණනයට අහිමි කර තිබුණි.

(ඈ) ගෙවීම් වවුචර් ඉදිරිපත් නොකිරීම
---------------------------------------

පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින්, සමාලෝචිත වර්ෂයට අදාල රු.16,908,440 ක් වටිනා ගෙවීම් වවුචර් 157 ක් සහ ඉකුත් වර්ෂයට අදාල රු.23,987,757 ක් වටිනා ගෙවීම් වවුචර් 31 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි .

| | ආයතනය | සමාලෝචිත වර්ෂය | | ඉකුත් වර්ෂය | |
|---|---|---|---|---|---|
| | | වවුචර් ගණන | වටිනාකම | වවුචර් ගණන | වටිනාකම |
| | | - | රු. | | රු. |
| 1. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (අනුරාධපුර කළාපය) | - | - | 23 | 495,947 |
| 2. | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව (අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය) | 157 | 16,908,440 | - | - |
| 3. | ප්‍රධාන අමාත්‍යාංශය (සංචාරක මධ්‍යස්ථානය) | - | - | 08 | 23,491,810 |
| | එකතුව | 157 | 16,908,440 | 31 | 23,987,757 |

2.2.6 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) පනත් | රු. | |
| 1939 අංක 48 දරන ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනතේ 31 වන පරිච්ඡේදයේ 51(1) වගන්තිය | | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මඩාටුගම සහතික කළ පාසලට අදාලව, සහතික කළ පාසලක තිබිය යුතු ප්‍රමිතගත තත්ත්වය සහ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ස්ථාවර නියෝග සකස් කර සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වන වගන්තිය | 2,935,330 | අර්ථසාධක අරමුදලේ දායකය ගණනය කිරීමේදී සැලකිල්ලට ගත යුතු යැයි පනතේ දක්වා ඇති මුළු ඉපැයීම්වලට අමතරව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වෙනත් ඉපැයීම්ද සැලකිල්ලට ගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතුව තිබුණු රු.4,469,281 ක මුදල රු.2,935,330 කින් ඉක්මවා රු.7,404,611 ක් එකී අරමුදලට ගෙවා තිබුණි. |
| 1987 අංක 42 දරන පළාත් සභා පනත | 6,893,798 | පනතේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස සභා නායක, විපක්ෂ නායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක යන තනතුරු 04 ක් ඇති කර පළාත් සභා මන්ත්‍රීවරයෙකුට හිමි වරප්‍රසාද ඉක්මවා අනිසි ලෙස වරප්‍රසාද ලබා දී තිබුණු අතර අදාල තනතුරුධාරීන් වෙත 2015 වර්ෂයේදී ලබාදී තිබුණු වරප්‍රසාද වෙනුවෙන් රු.6,893,798 ක් ගෙවා තිබුණු අතර ඉකුත් වර්ෂ තුනේදී ලබාදී තිබුණු එකී වරප්‍රසාද වෙනුවෙන් රු.17,517,886 ක් ද ගෙවා තිබුණි. |
| 1993 අංක 18, 1988 අංක 47 සහ 1982 අංක 3 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනත් වලින් සංශෝධිත 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ 44 වගන්තිය | 733,836 | සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ දායකය ගණනය කිරීමේදී සැලකිල්ලට ගතයුතු යැයි පනතේ දක්වා ඇති මුළු ඉපැයීම් වලට අමතරව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වෙනත් ඉපැයීම්ද සැලකිල්ලට ගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතුව තිබුණු රු.1,117,320 ක මුදල රු.733,836 කින් ඉක්මවා රු.1,851,156 ක් එකී අරමුදලට ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත<br>------------------------------ | | |
| 5 (4) (ආ) වගන්තිය | 68,445 | සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම ගිය නිලධාරියෙකු වෙත ඔහුගේ විශ්‍රාම පාරිතෝෂිකය නියමිත දිනට මාස 02 කුත් දින 18 ක් ප්‍රමාද වී ගෙවීම හේතුවෙන් ගෙවිය යුතු වූ අධිභාරය එකී නිලධාරියාට ගෙවා නොතිබුණි. |
| 20 වගන්තිය | 7,852,651 | පාරිතෝෂික ප්‍රතිපාදන ගණනය කිරීමේදී සැලකිල්ලට ගතයුතු යැයි පනතේ දක්වා ඇති මුළු ඉපැයීම්වලට අමතරව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වෙනත් ඉපැයීම්ද සැලකිල්ලට ගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික ප්‍රතිපාදන ලෙස වෙන්කල යුතුව තිබුණු රු. 10,438,879 ක මුදල රු. 7,852,650 කින් ඉක්මවා රු. 18,291,529 ක් එකී අරමුදලට වෙන්කර තිබුණි. එම අධි ප්‍රතිපාදන ගණනය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම ගිය නිලධාරියෙකු වෙත රු.33,412 ක් විශ්‍රාම පාරිතෝෂික ලෙස වැඩිපුර ගෙවා තිබුණි. |

(ආ) ප්‍රඥප්ති
---------

| | | |
|---|---|---|
| 1998 අංක 01 දරන උතුරු මැද පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ 15(3) වගන්තිය, 2007 උතුරුමැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටිය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 412 | 2,197,350 | ප්‍රඥප්තියේ, බඳවා ගැනීමේ පරිපාටියේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්ට අනුකූල නොවන ලෙස පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ නිලධාරියෙකු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලන නිලධාරී තනතුරට පත්කර එකී නිලධාරියාට හිමි ප්‍රමාණයට වඩා ඉහල වැටුප්, දීමනා හා වරප්‍රසාද ලබාදීම හේතුවෙන් 2011 දෙසැම්බර් 08 දින සිට 2016 ජූනි 30 දක්වා කාල පරිච්ඡේදයට අදාලව රු.2,197,350 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

(ඇ) ආයතන සංග්‍රහය
--------------------

| | | |
|---|---|---|
| II පරිච්ඡේදයේ 13 වන වගන්තිය | 1,267,493 | විධිමත් වැඩ බැලීමේ පත්කිරීමක් සිදුකර වැඩ බැලීමේ දීමනාවක් හෝ රාජකාරි ඉටුකිරීමේ දීමනාවක් හෝ ගෙවීම වෙනුවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල 02 ක, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සහ රෝහලක රාජකාරි ආවරණය කල වෛද්‍යවරුන් 05 දෙනෙකු වෙත ඔවුන්ට දිනකට හිමි අමතර රාජකාරි (අතිකාල) පැය 04 ට අදාල දීමනාවලට අමතරව තවත් අමතර රාජකාරි (අතිකාල) පැය 04 කට අදාල දීමනා දෛනිකව ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | **XIV** පරිච්ඡේදයේ 2 හා 3 වගන්ති උපවගන්ති | 16,020 | පොළොන්නරුව රාජකීය විද්‍යාලය, ස්ථිර සේවා ස්ථානයට ආසන්නව පිහිටා තිබියදී, නිලධාරියා පදිංචි ස්ථානයේ සිට පොළොන්නරුව රාජකීය විද්‍යාලයේ භාණ්ඩ සමීක්ෂණයට යාම වෙනුවෙන් පොළොන්නරුව කළාප අධ්‍යාපන කාර්යාලය විසින් ගෙවීම් වවුචර් 02 ක් මගින් වැඩිපුර සංයුක්ත දීමනා හා ගමන් වියදම් ගෙවා තිබුණි. |
| | **XIV** පරිච්ඡේදයේ 4.1.1 වගන්තිය | 722,722 | සංයුක්ත දීමනා ගෙවනු ලබන පුහුණු කාලසීමාවේ උපරිමය සති 02ක් විය යුතු වුවත් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් පුහුණු පාඨමාලා සඳහා සහභාගී වූ නිලධාරීන් 21දෙනෙකුට සති 02 ක කාලය ඉක්මවා සංයුක්ත දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) | පළාත් මූල්‍ය රීති<br>-------------------- | | |
| | 54 | - | 2013 ජනවාරි 04 සිට 2015 ජූලි 17 දක්වා කාල පරිච්ඡේදයේදී පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහනවලට සිදුවී ඇති අනතුරු 12 ක් සම්බන්ධයෙන් වූ පරීක්ෂණයන් සිදුකර නොතිබුණි. |
| | 146.3.4 | 157,402,084 | ඉදිකිරීම් නිමකර අදාල ලියකියවිලි, ගෙවීම සඳහා ඉදිරිපත් වී ඇතත් ගෙවීමට පෙර කළයුතු දෙපාර්තමේන්තු කාර්යයන් 2014 දෙසැම්බර් 31 දිනට නිමකිරීමට නොහැකි බවට සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් තැන්පත් ගිණුමට මාරු කර තිබුණු රු.162,545,141 ක මුදලින් 2015 දෙසැම්බර් 31 දින වන විටද ගෙවීම් නොකර ඉතිරි කර තිබුණු මුදල රු.157,402,084 ක් වී තිබුණි. |
| | 283.4 | 8,502,901 | නිකුත් කල නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකර මාස 06 ක කාලයක් ඉකුත් වූ චෙක්පත් 16 ක් සම්බන්ධයෙන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය | 65,379,447 | උතුරු මැද පළාත් සභාවේ ආයතන 03 ක් විසින් භාණ්ඩ හා සේවා ලබාගැනීම වෙනුවෙන් සහ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.555,582,407 ක් වූ මුදල මත රු.65,379,447 ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණද ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත |

මාසිකව වාර්තා කර නොතිබුණි.

| ආයතනය | ලබාගත් වැඩ, භාණ්ඩ හා සේවාවල වටිනාකම | ගෙවා ඇති එකතු කල අගය මත බදු මුදල |
|---|---|---|
| | රු. | රු. |
| ප්‍රධාන අමාත්‍යාංශය | 87,698,804 | 9,511,679 |
| පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 450,891,376 | 53,998,623 |
| පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 16,992,227 | 1,869,145 |

(ඊ) වෙනත්

| | | |
|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ඊඩී/1/27/1/5/1/2007 දරන 2007 දෙසැම්බර් 13 දිනැති චක්‍රලේඛය | - | පොළොන්නරුව හා හිඟුරක්ගොඩ අධ්‍යාපන කලාපවලට අයත් පළාත් සභා පාසල්වල ගුරුභවතුන් 663 දෙනෙකු අවුරුදු 06 සිට අවුරුදු 25 ක් අතර කාලයක්, එකම පාසලේ සේවය කරනු ලබන බව නිරීක්ෂණය විය. |

2.2.7 ප්‍රමාණවත් අධිකාරී බලයක් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) උතුරු මැද පළාතේ සෝයා බෝංචි වගා කරනු ලබන ගොවීන් වෙත සියයට 50 ක ප්‍රතිලාභී දායකත්වය මත 2012 වර්ෂයේදී බෙදා හැරීමට උතුරු මැද ප්‍රධාන අමාත්‍යාංශය විසින් එම වර්ෂයේදී රු.279,300,000 ක මුදලකට මිලට ගෙන තිබුණු කෘෂිකාර්මික ජල පොම්ප 3750 කින් 2015 වර්ෂය අවසාන වන විටද රු.15,640,800 ක් වූ ජල පොම්ප 210 ක් බෙදා නොහැර සැපයුම්කරුගේ ගබඩාවේ රඳවා තිබුණි.

(ආ) පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව ඒ ඒ වර්ෂවල දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල ඉතිරි වූ අග්‍රිම ශේෂයන් ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනට පෙර පළාත් භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 14(ආ) ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 09 ක අග්‍රිම ගිණුම්වල නිරවුල් නොකළ හර ශේෂයන්හි එකතුව රු.37,525,737 ක් විය. ඉන් සියයට 70 ක් හෙවත් රු.26,405,861 ක් ප්‍රධාන අමාත්‍යාංශය විසින් පියවිය යුතුව තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාව සමඟ වූ සටහන 15 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 05 ක එකතුව රු.1,634,162 ක් වූ බැර ශේෂයක් සහ වාණිජ අත්තිකාරම් ගිණුම් 02 ක එකතුව රු.1,497,081 ක් වූ බැර ශේෂයක් විය.

(ඇ) සභාපතිවරයාට හා උප සභාපතිවරයාට හිමි පෞද්ගලික කාර්ය මණ්ඩලවලට අදාල වැටුප් හා දීමනා ලෙස පිළිවෙලින් රු.4,450,980 ක් හා රු.999,480 ක් ගෙවා තිබුණි. එසේ වුවද ඊට අමතරව එකී ධූරධාරීන් දෙදෙනා වෙත පළාත් සභා මන්ත්‍රීවරයෙකුට හිමි පෞද්ගලික කාර්ය මණ්ඩල වෙනුවෙන්ද වැටුප් හා දීමනා ගෙවා තිබුණු අතර ඒ සඳහා එකී ධූරධාරීන් දෙදෙනා වෙත ගෙවා තිබුණු වැටුප් හා දීමනා එකතුව රු.1,515,120 ක් විය.

3. ආදායම් කළමනාකරණය
------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභාව විසින් ආදායම් ශීර්ෂ 21 ක් යටතේ රු.2,817,577,088 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදී රැස්කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ රු.2,751,657,246 ක් වූ ආදායම සමඟ සැසඳීමේදී සියයට 2 ක එනම් රු.65,919,842 ක වර්ධනයක් පෙන්නුම් කරන නමුත් ඉකුත් වර්ෂයේ එහි වර්ධනය සියයට 18 ක් හෙවත් රු.424,886,828 ක් විය. එසේම සමාලෝචිත වර්ෂයේ ශීර්ෂ 21 යටතේ වූ එකී ආදායම පළාත් සභාවේ මුළු ආදායමින් සියයට 17 ක් වූ අතර එම ප්‍රතිශතය ඉකුත් වර්ෂයේ සියයට 21ක් විය.

(ආ) පළාත් සභාව ආරම්භ කර අවුරුදු 26 ක් ඉක්ම ගොස් ඇතත් පළාත තුල පිහිටි උගස් මධ්‍යස්ථාන නියමානුකූල කර ඒවා ලියාපදිංචි කිරීමේ හා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු අයකිරීමට අදාල ප්‍රඥප්තියක් අනුමත කරගෙන නොතිබුණි. උගස් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සහ ඒවාට අදාල ගාස්තු අයකිරීම පිළිබඳ උපදෙස් පළාත් සභාව විසින් ලබාදී නොමැති බැවින් එකී කටයුතු සිදුකල නොහැකි බවත් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මතය විය.

(ඇ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් අධිකරණ දඩ අයකිරීම සඳහා උතුරු මැද පළාතේ අධිකරණ වෙත එන්සී - 100 ආකෘති පත්‍ර නිකුත් කර ඇති නමුත්, එම පොත්වලින් අයකල දඩ පිළිබඳව පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණු බැවින් අධිකරණයන් විසින් ප්‍රේෂණය කරන ලද දඩ මුදල් ප්‍රමාණයේ නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය. එසේම පාවිච්චි කල රිසිට් පොත් ආපසු ලබා ගැනීමකින් තොරව නැවත රිසිට් පොත් නිකුත් කිරීමද කර තිබුණි.

(ඈ) පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් බදු අයවිය යුතු ඉඩම් ප්‍රමාණය හා අයවිය යුතු බදු ප්‍රමාණය පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් ඉඩම් බදු ආදායම නිශ්චිතව ඇස්තමේන්තු කිරීමට නොහැකි වී ඇති අතර වර්ෂය අවසානයට හිඟ බදු ආදායම ගණනය කර ගැනීමටද නොහැකි වී තිබුණි.

4 මූල්‍ය සමාලෝචනය
-----------------------
4.1 මූල්‍ය ප්‍රතිඵල
----------------
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.1,704,796,896 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.63,101,757 ක් විය.

4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු.3,230,767,070 කින් වැඩි වී තිබුණු නමුත් මූල්‍ය ප්‍රතිඵලය රු.1,767,898,656 කින් වර්ධනය වී තිබුණි. ඒ සඳහා රජයේ ප්‍රදාන රු.4,253,557,363 කින්, බදු ආදායම රු.80,425,794 කින් හා බදු ප්‍රදාන රු.31,825,390 කින් වැඩිවීම සහ පළාත් ආයෝජන (ප්‍රාග්ධන සංක්‍රාම) රු.634,205,290 ක් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

5. අධිකාරී ගිණුම්/අරමුදල් ගිණුම් හා වාණිජ අත්තිකාරම් ගිණුම්

------------------------------------------------------------------

5.1 අධිකාරී ගිණුම්/අරමුදල් ගිණුම්

----------------------------------

උතුරු මැද පළාත් සභාව විසින් අනුමත කල ප්‍රඥප්ති යටතේ අධිකාරී 05 ක් පිහිටුවා ඇති අතර අරමුදල් 05 ක් ආරම්භ කර ඇත. විස්තර පහත දැක්වේ.

5.1.1 උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

--------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ ගණනාවක සිට අයවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.158,082 ක් වූ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ සේවක ණය ශේෂයක් සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ගොස් ඇති සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 16 දෙනෙකුගෙන් අයවිය යුතු රු.627,718 ක් වූ ණය ශේෂයන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේදී ගංවතුරින් හානියට පත් මාර්ග පුනරුත්ථාපනය කිරීමට අදාල බිල්පත් නිරවුල් කිරීම මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබාගෙන සිදුකලයුතු වුවත්, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු රු. මිලියන 93 ක් ආපසු ලබාගෙන එම බිල්පත් නිරවුල් කිරීම හේතුවෙන් ස්ථාවර තැන්පතු මත අධිකාරියට ලබාගත හැකිව තිබුණු රු.1,976,690 ක් වූ පොලී මුදලක් අහිමිව ගොස් තිබුණි. එසේම කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත් මත රඳවාගත් මුදල් නිදහස් කිරීමටද නොහැකි වී තිබුණි.

(ඇ) අධිකාරිය විසින් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණු අතර අධිකාරියේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සම්බන්ධව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව විසින්ද සිදු කර නොතිබුණි.

(ඈ) කාර්තුවකට එක් වරක්වත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී එකී කමිටු පවත්වා නොතිබුණි.

5.1.2 උතුරු මැද පළාත් පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරිය

-----------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් මූල්‍ය රීති 261.2.2 හි විධිවිධාන ප්‍රකාරව එක් අවස්ථාවකදී නිකුත් කල හැකි අත්තිකාරම් සීමාව රු.100,000 ක් වන නමුත් පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය විසින් එකී සීමාව ඉක්මවා අවස්ථා 03 කදී රු.433,200 ක මුදලක් අත්තිකාරම් ලෙස ලබා දී තිබුණි.

(ආ) 2007 අගෝස්තු 24 දිනැති අංක 09/2007(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විශ්‍රාම ගිය නිලධාරීන් යලි රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී අත්‍යාවශ්‍ය තනතුරුවලට පමණක් අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පෞද්ගලික නිර්දේශය මත මාස 12 ක උපරිම කාලයකට යටත්ව නිසි බලධරයාට පත් කල හැකි වුවත්, පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂක විසින් පරිපාලන නිලධාරි හා මුදල් සහකාර තනතුර සඳහා නිලධාරීන් දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත පත් කර තිබූ අතර එම නිලධාරීන් දෙදෙනා 2015 දෙසැම්බර් 31 දින වන විට වසර 02 ක් හා මාස 06 ක කාලයක් තුල රාජකාරි කටයුතු සිදු කර රු. 2,338,500 ක මුදලක් වැටුප් වශයෙන් ලබා ගෙන තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ අවසාන මාස 03 සඳහා ගෙවිය යුතු ලෙස පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ ගිණුම්වල දැක්වෙන රු.3,000,000 ක් වූ ගුරු දීමනා 2015 වර්ෂයේදී ද ගෙවීමට කටයුතු කර නොතිබුණි.

5.1.3 උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

---------------------------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනතෙහි විධිවිධාන ප්‍රකාරව පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය විසින් 1999 වර්ෂයේ සිට 2002 වර්ෂය දක්වා එකතු කර තිබුණු රු.11,744,400 ක භාණ්ඩ හා සේවා බදු මුදල්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය විසින් අනියම්/කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ සේවකයන් 18 දෙනෙකු සඳහා 2014 ජනවාරි සිට 2015 ජූලි දක්වා වැටුප් වශයෙන් රු.3,068,170 ක මුදලක් ගෙවීම් කර ඇතත්, 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත සහ 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතට අනුව අදාල දායක මුදල් 2016 ජූලි මාසය වන විටත් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය විසින් 2005 සහ 2006 වර්ෂවලට අදාල සේවක භාරකාර අරමුදලේ දායක මුදල් නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම නිසා රු.206,873 ක අධිභාරයක් පනවා තිබුණු නමුත් එම මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පළාත් සංවර්ධන නිර්මාණ යන්ත්‍රෝපකරණ ඒජන්සියේ බැංකු ගිණුම් 02 ක ශේෂයක් නොමැතිව තිබියදී 2015 ජනවාරි මාසයේදී රු.84,236 ක් වූ චෙක්පත් 07 ක් නිකුත් කර තිබුණි.

(ඉ) පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියේ මාස 08 ත් වර්ෂ 07 ත් අතර කාලයක් තුල සේවයෙන් ඉවත් ව ගොස් තිබෙන සහ විශ්‍රාම ගොස් තිබෙන නිලධාරීන් 09 දෙනෙකුට ගෙවිය යුතු රු.941,319 ක් වූ විශ්‍රාම පාරිතෝෂික අරමුදල් අදාල නිලධාරීන් වෙත ගෙවා නොතිබුණි.

5.1.4 උතුරු මැද පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය

-----------------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව පෞද්ගලික ගමන් සඳහා නිල වාහන පාවිච්චි කිරීමට අවසර ඇති නිළධාරීන්ට නිල වාහන සැපයීම වෙනුවට රු.30,000 ක මාසික ප්‍රවාහන දීමනා ලබාගත හැකි වුවද, උතුරු මැද පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපතිවරයා මසකට රු.40,000 ක් බැගින් ප්‍රවාහන දීමනාව ලබාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.120,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට හා සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම ප්‍රමාදවීම මත පිළිවෙලින් රු.28,765 ක් හා රු.18,240 ක් වශයෙන් එකතුව රු.47,005 ක මුදලක් අධිභාර වශයෙන් උතුරු මැද පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් ගෙවා තිබුණු නමුත් එකී මුදල, දායක මුදල් ගෙවීම ප්‍රමාද කල නිලධාරීන්ගෙන් අය කරගෙන නොතිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩල සීමාව ඉක්මවා වේලා සටහන්කරුවන් 10 දෙනෙකුද, කම්කරුවන් 07 දෙනෙකුද, කළමනාකරණ සහකාරවරුන් 08 දෙනෙකුද සේවයේ යොදවා තිබුණු අතර ඔවුන්ට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.6,307,862 ක් ගෙවා තිබුණි.

5.1.5 උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදල

-----------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂ 03 කට අදාල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ වූ රු.5,185,974 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.47,537 ක් වී තිබුණි.

5.1.6 උතුරු මැද පළාත් දිරිදීමනා අරමුදල

---------------------------------------

වත්කම් හා බැරකම් ප්‍රකාශනයේ ප්‍රාග්ධනයට එකතුකර දැක්විය යුතුව තිබුණු ඉකුත් වර්ෂයේ රු.3,764,973 ක් වූ අතිරික්තය එහි මුදල් ශේෂය ලෙස දක්වා තිබුණු අතර එකී ශේෂය සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ ආරම්භක ශේෂය ලෙසද දක්වා තිබුණි. එම නිසා රු.3,082,335 ක් විය යුතුව තිබුණු සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.697,638 ක අතිරික්තයක් වී තිබුණි.

5.1.7 උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන අරමුදල

-----------------------------------------------

2011 අංක 03 දරන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ප්‍රකාරව 2012 ජනවාරි මාසයේදී ආරම්භ කර තිබුණු මෙකී අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳවත් විගණකාධිපති විසින් විගණනය සිදුකලයුතු බවටත් විධිවිධාන ප්‍රඥප්තියට ඇතුලත් කර නොතිබුණි. එසේ වුවද ප්‍රඥප්තියේ 26 (2) වගන්තිය ප්‍රකාරව මෙම අරමුදල 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 3 කොටසේ විධි විධානවලට අනුකූල විය යුතු බැවින් අරමුදලේ විගණනය විගණකාධිපති විසින් සිදුකල යුතුව ඇත. එමනිසා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් අරමුදල ආරම්භ කල වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,047,235 ක් වූ අරමුදලේ ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.217,613 ක් වී තිබුණි.

5.1.8 උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල
-----------------------------------------------------
2005 ජනවාරි මාසයේදී ආරම්භ කර ක්‍රියාත්මක කර තිබුණු මෙකී අරමුදලට අදාලව ඉකුත් වර්ෂ 10 කට සහ සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,331,893 ක් වූ අරමුදලේ ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.32,679 ක් වී තිබුණි.

5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්
------------------------------
රජරට එෆ්.එම්.සේවා අත්තිකාරම් ගිණුම
---------------------------------------------
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ උතුරු මැද පළාත් සභාව අතර රජරට එෆ්.එම්.සේවයේ ගුවන් කාලය වෙන්කර ගැනීම සඳහා වූ ගිවිසුම 2014 මාර්තු 31 දින සිට අවසන්ව තිබියදී , වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තක යෙදවීමට තිබුණු රු. මිලියන 03 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී එකී අක්‍රිය අත්තිකාරම් ගිණුම් කටයුත්ත වෙනුවෙන් වෙන්කර තිබුණි.

6. මෙහෙයුම් සමාලෝචනය
------------------------------
6.1 කාර්යය සාධනය
---------------------
6.1.1 උතුරු මැද පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආදායම් ශීර්ෂ 07 ක් යටතේ ඇස්තමේන්තු කර තිබුණු රු.301,150,000 ක ආදායම රු.71,886,638 කින් ඉක්මවා රු.373,036,638 ක ආදායමක් රැස්කර තිබුණු නමුත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සෘජුවම දායකවී තිබුණේ ඉන් සියයට 7 ක් වූ රු.26,700,843 ක් රැස්කිරීමට පමණක් බව නිරීක්ෂණය විය. මත්පැන් බලපත්‍ර ගාස්තු, අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු සහ උසාවි දඩ ඇතුළු ඉතිරි රු.346,335,795 ක ආදායම් රැස්කිරීම වෙනත් ආයතනවලින් සිදුකර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණු අතර එකී ආයතනවල එම ආදායම් රැස්කිරීමට අදාල කටයුතු අධීක්ෂණය හෝ පසු විපරම් කටයුතු ප්‍රමාණාත්මක ලෙස පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් සිදුකල බවට සාක්ෂි නොවීය. සමාලෝචිත වර්ෂය අවසානයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සෘජුවම රැස්කල ආදායම රු.26,700,843 ක් වූ අතර එකී ආදායම් රැස්කිරීමේදී දරන ලද වියදම රු.28,448,857 ක් වී තිබුණි. ඒ අනුව රු.100 ක ආදායමක් ඉපැයීමට රු.106.55 ක් වැයකර තිබුණි.

6.1.2 උතුරු මැද පළාතේ අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් පසුගිය වර්ෂ තුනකට අදාළව ප්‍රතිඵල පිළිබඳ විශ්ලේෂණයේදී පළමුවරට විභාගයට පෙනී සිටින ශිෂ්‍යයන්ගෙන් විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රිසි යන විෂයයන් අසමත්වීමේ ප්‍රතිශතය ඉහළ අගයක් ගෙන තිබුණු අතර එම සිසුන් උසස් අධ්‍යාපන කටයුතු වලින් ඉවත්වීම තුළ සමාජමය ගැටළු නිර්මාණය වීමේ ඉඩ කඩද පුළුල් වී නැතැයි පිළිගත නොහැක.

| | 2015 | | | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| විෂයය | පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | අසමත් ගණන | ප්‍රතිශතය | පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | අසමත් ගණන | ප්‍රතිශතය | පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | අසමත් ගණන | ප්‍රතිශතය |
| ------ | -------- | ------ | ------ | ------- | ------- | ---- | -------- | ------- | ------ |
| විද්‍යාව | 16473 | 5680 | 34 | 16193 | 7309 | 45 | 16692 | 6010 | 36 |
| ගණිතය | 16455 | 8358 | 51 | 16159 | 7732 | 48 | 16677 | 8237 | 49 |
| ඉංග්‍රිසි | 16454 | 10553 | 64 | 16112 | 10565 | 66 | 16674 | 10453 | 63 |

6.1.3 2016 වර්ෂයට අවිච්ඡේද නොකළ යුතු යැයි විශේෂයෙන් සඳහන් කර තිබුණු රු.2,743,308 ක්වූ ව්‍යාපෘති 03 ක් සහ සමාලෝචිත වර්ෂය තුල නිම කිරීමට සැලසුම් කර තිබුණු ඇස්තමේන්තුගත වටිනාකම රු.49,411,384 ක් වූ ව්‍යාපෘති 214 ක් සමාලෝචිත වර්ෂයේදී නිම නොකර 2016 වර්ෂයට අවිච්ඡේද කර තිබුණි.

6.1.4 සියලු පහසුකම් සහිත සූතිකාගාරයක් කැකිරාව දිස්ත්‍රික් රෝහල සතුව පවතින නමුත්, පසුගිය වර්ෂයන් හා සැසඳීමේදී 2015 වර්ෂයේ අගෝස්තු වනවිට රෝහලේ දරු උපත් ප්‍රමාණය 324 සිට 62 දක්වා අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, දඹුල්ල, අනුරාධපුර රෝහල් වෙත රෝගීන් මාරු කිරීම් දක්නට ලැබුණි.

6.1.5 පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය රෝහල් 06 ක හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල 02 ක වටිනාකම රු.290,549 ක් වූ ඖෂධ වර්ග 70 කට අයත් ඒකක 33845 ක් වූ කල් ඉකුත් වූ ඖෂධ තොගයක් හොඳ තත්ත්වයේ පවතින ඖෂධ සමඟ තබා තිබීම තුළ රෝගීන්ට කල් ඉකුත් වූ ඖෂධ නිකුත් කිරීමේ අවදානමක් පැවතුණි.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සංචාරක තොරතුරු පත්‍රිකා, සංයුක්ත තැටි, ආකර්ශනීය සංචාරක ස්ථාන පිළිබඳ දැන්වීම් පුවරු, සංචාරක තොරතුරු මධ්‍යස්ථානයට අනුයුක්ත කරන නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව, මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට අවශ්‍ය නිරන්තර මග පෙන්වීම් යනාදී පහසුකම් සහ මග පෙන්වීම් ලබාදීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා එකඟ වී තිබියදීත් එකී පහසුකම් සහ මග පෙන්වීම් ලබා ගෙන සංචාරක තොරතුරු මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා කටයුතු කර නොතිබුණු අතර රු.23,491,810 ක් වැයකර ඉදිකර තිබුණු සංචාරක තොරතුරු මධ්‍යස්ථානය මාසිකව හෝ වාර්ෂිකව කිසිඳු බදු මුදල් අයකිරීමකින් තොරව ආදායම් උපයමින් පවත්වාගෙන යාමට පෞද්ගලික පාර්ශවයකට උතුරු මැද පළාත් සභාව විසින් නිදහස් බදු ගිවිසුමකින් පවරා දී තිබුණි.

(ආ) උතුරු මැද පළාත් සභාවේ ආයතන 04 ක සේවය කර පළාත් සභාවේ වෙනත් ආයතනවලට සහ පළාත් සභාවෙන් පිටතට ස්ථාන මාරු වී ගොස් ඇති නිලධාරීන් 331 දෙනෙකුගෙන් අයවිය යුතු රු.9,653,017 ක් සහ ආයතන 06 ක සේවය කර මියගිය, විශ්‍රාම ගිය සහ සේවය හැර ගිය නිලධාරීන් 64 දෙනෙකුගෙන් අයවිය යුතු රු.3,699,528 ක් අයකර ගැනීමටද, ආයතන 05 ක් වෙත ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 197 දෙදෙනෙකුට අදාල රු.5,371,202 ක් පියවීමටද කටයුතු කර නොතිබුණි. එකී ණය ශේෂයන් අවුරුදු 03 ට අධික කාලයක සිට ගිණුම්වල අනාවරණය කරමින් පැවති බවද නිරීක්ෂණය විය.

| ගිණුම් අංකය | ස්ථාන මාරුවී ගිය නිලධාරීන් | | ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් | | මියගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය නිලධාරීන් | |
|---|---|---|---|---|---|---|
| | නිලධාරීන් ගණන | මුදල | නිලධාරීන් ගණන | මුදල | නිලධාරීන් ගණන | මුදල |
| | | රු. | | රු. | | රු. |
| 66001 | 47 | 2,596,214 | 48 | 2,235,771 | 4 | 292,360 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 66201 | - | - | 02 | 270,814 | 1 | - |
| 66501 | - | - | - | - | 1 | 160,380 |
| 61001 | 41 | 1,013,864 | 85 | 2,514,402 | 7 | 121,890 |
| 61201 | 232 | 5,703,310 | 55 | 198,025 | | |
| 62001 | 11 | 339,629 | 07 | 152,190 | 1 | 52,159 |
| 60111 | - | - | - | - | 2 | 240,000 |
| 63101 | - | - | - | - | 48 | 2,832,739 |

(ඈ) ඉකුත් වර්ෂවලදී සිසුන් නොමැතිවීම හේතුවෙන් වසා දමා තිබුණු උතුරුමැද පළාතේ, පළාත් පාසල් 41 ක් පවත්වාගෙන ගිය ඉඩම් හා ගොඩනැගිලි ප්‍රාදේශීය ලේකම්වරුන්ට භාර දී නොතිබුණු අතර පාසල් 17 ක් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ විධිමත් අනුමැතියකින් තොරව වෙනත් ආයතනවලට ලබාදී තිබුණි.

(ඇ) 2007 ජූනි 11 දිනැති අංක එන්එස්සීසී/3/1/2/iv දරන ජාතික වැටුප් සහ සේවක කොමිෂන් සභා ලේකම්වරයාගේ චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 චක්‍රලේඛයට අනුව උතුරු මැද පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කර්මාන්ත ව්‍යාප්ති නිලධාරීන්ගේ වැටුප් ගැලපීමේදී එම් එන් - 07 වැටුප් ක්‍රමය ලබා දීම සාවද්‍ය බැවින් එම තනතුර සඳහා අදාලවන එම් එන් - 04 වැටුප් ක්‍රමයේ 02 වන පියවර අනුව නිවැරදි කිරීමේදී 2006 වර්ෂයේ ජනවාරි මස සිට 2013 සැප්තැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුල කර්මාන්ත ව්‍යාප්ති නිලධාරීන් 05 දෙනෙකුට වැඩිපුර ගෙවීම් කර තිබුණු රු.3,262,447 ක මුදල 2015 ජූනි 30 දින වන විටද වාරික වශයෙන් හෝ ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේදී තීරු බදු රහිතව මිලට ගෙන තිබුණු ඉන්වොයිස් මිල රු.216,019,620 ක් වූ වාහන 73 ක් රක්ෂණය කිරීම සඳහා මිල ගණන් කැඳවීමේදී වාහන සැපයුම්කරුවන්ගෙන් ඒවායේ වෙළඳපොල වටිනාකම් තහවුරු කර ගැනීමකින් තොරව පිරිවැය, රක්ෂණය සහ ගැල්කුලී (CIF) වටිනාකම ප්‍රධාන ලේකම් විසින් රක්ෂණ සමාගම් වෙත ලබා දී තිබුණු අතර මිල ගණන් ඉදිරිපත් කර තිබුණු රක්ෂණ සමාගම් විසින් විවිධ වෙළඳපොල වටිනාකම් දක්වමින් තම මිල ගණන් ඉදිරිපත්කර තිබුණි. වාහනවල ඉන්වොයිසි වටිනාකම්වල සහ රේගු බදුවල රු.450,505,329 ක් වූ එකතු වටිනාකම රු.58,844,671 කින් ඉක්මවා රු.509,350,000 ක වෙළඳපොල වටිනාකමකට එකී වාහන 73 රක්ෂණය කර තිබුණි.

(ඊ) අතිගරු ජනාධිපතිතුමාගේ එකඟතාවය ලබා නොගෙන ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් හා නිලධාරීන් ඇතුළු 45 දෙනෙකු වෙනුවෙන් සැලසුම්කර තිබුණු තායිලන්තය හා කොරියාව සංචාරයේ කටයුතු සූදානම් කිරීම සඳහා විදේශ සංචාරයන් සංවිධානය කරනු ලබන ආයතනයකට රු.7,921,800 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර අති ගරු ජනාධිපතිතුමා විසින් එකී සංචාරය අත්හිටුවීම හේතුවෙන් එකී අත්තිකාරම් මුදලින් රු.3,921,800 ක් ආපසු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම සංචාරය සඳහා අති ගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති නිසා අලාභය සඳහා නිලධාරීන් වගකීමට නොබැඳෙන බව දක්වමින් එකී අලාභය 2014 දෙසැම්බර් 31 දින කපා හැර තිබුණි.

6.3 මධ්‍යම රජයේ ප්‍රතිපත්තිවලට පටහැනි වූ ගනුදෙනු හා ක්‍රියාකාරකම්

---

පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ආයතනමය කරුණු ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය සේවයේ අනුරූප ධූර දරන නිලධාරීන් සඳහා අනුගමනය කෙරෙන ක්‍රියාපරිපාටි හැකිතාක් දුරට අනුගමනය කලයුතු වුවද, එසේ අනුගමනය කර නොතිබුණු අවස්ථා පහත දැක්වේ.

(අ) ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.4 ඡේදයේ වූ විධිවිධානයන්ට පටහැනිව ප්‍රධාන ලේකම්වරයා, අමාත්‍යාංශ ලේකම්වරුන් සහ ඒ හා සමාන නිලධාරීන්ගෙන් මාසිකව රු.500 ක උපරිමයකට යටත්ව නිවාස කුලී අය කිරීම නිසා එවැනි නිලධාරීන් 17 දෙනෙකුගෙන් 2015 වර්ෂයේ දී රු.831,695 ක් අඩුවෙන් නිවාස කුලී අයකරගෙන තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.8 ඡේදයේ වූ විධිවිධානයන්ට පටහැනිව ප්‍රධාන ලේකම්වරයා, අමාත්‍යාංශ ලේකම්වරුන් සහ ඒ හා සමාන නිලධාරීන් 17 දෙනෙකු පදිංචි රජයේ නිවාසවල ජල බිල්පත් හා විදුලි බිල්පත් වටිනාකමින් සියයට 70 ක් අදාල ආයතනවල වැය ශීර්ෂයන්ට හර කර ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එසේ ගෙවා තිබුණු මුදල රු.367,643 ක් විය. එසේම එකී එක් එක් නිලධාරියා වෙනුවෙන් ජල හා විදුලි බිල්පත් සඳහා පළාත් සභාව වැය කර තිබුණු මුදලෙහි විෂමතාවයක් ද විය.

6.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---

පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරයාගේ සහ පළාත් සභා අමාත්‍යවරුන්ගේ දීමනා සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලවල දීමනා සඳහා එක් එක් අමාත්‍යාංශ වැය ශීර්ෂයන් යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලින් එකී සම්පූර්ණ දීමනා ගෙවා තිබුණු නමුත් එකී ගෙවීම්වලට අතිරේකව පළාත් සභා සභා ලේකම් කාර්යාල වැය ශීර්ෂය යටතේ 2015 වර්ෂයේදී රු.4,877,400 ක මුදලක් ප්‍රධාන අමාත්‍යවරයාගේ සහ අනෙකුත් අමාත්‍යවරුන්ගේ රියදුරු දීමනා හා පෞද්ගලික කාර්යය මණ්ඩල දීමනා ලෙස ගෙවා තිබුණු අතර ඉකුත් වර්ෂ තුනේදී ගෙවා තිබුණු එකී දීමනාවල එකතුව රු.12,933,600 ක් විය.

6.5 අවිධිමත් ගනුදෙනු

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම

---

(i) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් මාසයේදී රු.2,138,000 කට දියර ඉසින යන්ත්‍ර 400 ක් මිලට ගැනීමේදී විෂයභාර අමාත්‍යවරයාගේ ලිඛිත ඉල්ලීම මත සුදුසුකම් ලැබූ පළමු සැපයුම්කරු දියර ඉසිනයක් සඳහා ඉදිරිපත් කර තිබුණු රු.10,000 ක මිලට වඩා රු.690 ක් වැඩි මිල ගණන් සහිත දියර ඉසින 400 ක් මිලට ගැනීම හේතුවෙන් රු.276,000 ක් වැඩිපුර ගෙවීමට සිදුව තිබුණි. ඉන් රු.138,000 ක් ප්‍රතිලාභීන්ගෙන් අයකර තිබුණු අතර රු.138,000 ක් වූ ඉතිරි අලාභයට අමාත්‍යවරයා වගකිව යුතු නමුත් එකී මුදල ඔහුගෙන් අය කර නොතිබුණි.

(ii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, රු.250,000 ක් ඉක්මවනු ලබන වැඩ සම්බන්ධයෙන් වූ කොන්ත්‍රාත්තුවක්, ලිඛිත හා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලෙස අදාල පාර්ශවයන්ගේ අත්සනින් යුතුව පැවතිය යුතු වුවද, ඊට පටහැනිව ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය විසින් රු.3,250,000 ක් වටිනා සමරු ඵලක ඉදිකිරීම් කටයුතු පුද්ගලික ආයතනයක් වෙත විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකින් තොරව ලබාදී තිබුණි.

(ආ) අධිකාරි බලය නොමැති වූ ගනුදෙනු
------------------------------------------

i. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හෝ වෙනත් පළාත් සභාවක සභා ලේකම් කාර්යාලයක හෝ නැති එසේම උතුරු මැද පළාත් සභාවේ පළාත් සභා සහ සභා ලේකම් කාර්යාලයේ අනුමත කාර්යය මණ්ඩලය තුලද නැති ප්‍රධාන සන්ධාන නිලධාරී හා නියෝජ්‍ය සන්ධාන නිලධාරී තනතුරු දෙක (02) සඳහා අදාල කාර්යය මණ්ඩලයේ සුළු සේවකයින් දෙදෙනෙකු 2014 නොවැම්බර් 01 දින සිට ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත බඳවා ගෙන තිබුණි. එකී පත්වීම් ලබාදීමට පෙර 2012 අප්‍රේල් 10 දින සිට අදාල තනතුරු දෙකෙහි රාජකාරී ඉටුකිරීමට පළාත් සභා හා සභා ලේකම් විසින් උක්ත නිලධාරීන් දෙදෙනා පත්කර තිබුණු අතර 2012 අප්‍රේල් 10 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා එකතු වටිනාකම රු.187,893 ක් එම නිලධාරීන් දෙදෙනා වෙත වැටුප් හා රාජකාරී ඉටුකිරීමේ දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

ii. උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් ඔහුට අනුයුක්ත කර තිබුණු වාහනය සඳහා 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව ලබාගත හැකි ඉන්ධන ලීටර් 1530 ක අනුමත ඉන්ධන සීමාව ඉක්මවා වටිනාකම රු.142,690 ක් වූ ඉන්ධන ලීටර් 1502 ක්ද, උක්ත චක්‍රලේඛය ප්‍රකාරව අනුමත ඉන්ධන දීමනාව හිමි නොවන උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් 05 දෙනෙකු විසින් වාහන 05 ක් සඳහා රු.816,335 ක් වූ ඉන්ධන ලීටර් 8593 ක්ද සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | නිලධාරියාගේ නම | තනතුර | ලබාගෙන තිබුණු ඉන්ධන ප්‍රමාණය | චක්‍රලේඛය ප්‍රකාර ඉන්ධන සීමාව | සීමාව ඉක්මවා ලබාගත් ඉන්ධන ප්‍රමාණය | සීමාව ඉක්මවා ලබාගත් ඉන්ධන වල වටිනාකම |
|---|---|---|---|---|---|---|
| | | | ලීටර් | ලීටර් | ලීටර් | රු. |
| 1. | අයි.ජී.විජිත කුමාර මයා | සභාපති | 3032 | 1530 | 1502 | 142,690 |
| 2. | එස්.ඩබ්.ටී.සී.සුනෙත් මයා | ගණකාධිකාරී (වැ.බ.) | 2271 | - | 2271 | 215,745 |
| 3. | ආර්.එච්.ඒකනායක මයා | පරිපාලන නිලධාරී | 2705 | - | 2705 | 256,975 |
| 4. | ඩබ්.එම්.ඒ.බී.වලිසුන්දර මයා | ඉංජිනේරු | 1580 | - | 1580 | 150,100 |
| 5. | බී.බී.කුමාරසිරි මයා | ඉංජිනේරු | 1359 | - | 1359 | 129,105 |
| 6. | සී.කේ.කුලවර්ධන මයා | ඉංජිනේරු | 678 | - | 678 | 64,410 |
| | | | | | | 959,025 |

6.6 දෘෂ්‍ය අක්‍රමිකතා

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2006 ජනවාරි 04 දිනැති අංක CSA/PI/40 දරන අතිගරු ජනාධිපතිතුමාගේ චක්‍රලේඛයට වැඩිමනත් ලෙස නිකුත් කර ඇති 2006 මාර්තු 18 දිනැති සමාංක දරන චක්‍රලේඛය සමඟ වූ ඇමුණුමේ 1(III) ප්‍රකාරව ප්‍රධාන අමාත්‍යවරයාට ලබාගත හැකි ඉන්ධන දීමනාව ඉක්මවා ඉන්ධන දීමනා ලබා දී තිබීම නිසාත්, වර්තමාන ප්‍රධාන අමාත්‍යවරයාගේ පරිහරණයට ලබා දීමට පෙර සාමාන්‍ය ඉන්ධන සපයා තිබුණු රජයේ වාහන 02 කට මෙන්ම කුලී පදනමට ලබාගෙන තිබුණු වාහනයට ද සුපිරි ඉන්ධන සපයා තිබීම නිසාත් ඩීසල් වාහන 02 ක් සහ පෙට්‍රල් වාහනයක් සඳහා ප්‍රධාන අමාත්‍යවරයාට හිමි රු.1,747,000 ක් වූ ඉන්ධන දීමනාව, රු.665,000 කින් ඉක්මවා රු.2,412,000 ක් 2015 පෙබරවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය සඳහා ගෙවා තිබුණි.

(ආ) 2016 ජනවාරි 04 දිනැති අංක සීඑස්ඒ/පීl/40 දරන චක්‍රලේඛයේ 1.1 ඡේදය ප්‍රකාරව ප්‍රධාන අමාත්‍යවරයෙකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය 15 දෙනෙකුගෙන් සමන්විත වියයුතු වුවද, උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය 28 දෙනෙකුගෙන් යුක්ත විය. ඒ අනුව ප්‍රධාන අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩල සාමාජිකයන් 13 දෙනෙකුගේ අතිරික්තයක් වූ අතර එකී නිලධාරීන් 13 දෙනා වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.4,254,412 ක් වැටුප්, දීමනා හා අතිකාල වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) හිටපු ප්‍රධාන අමාත්‍යවරයාගේ රාජකාරී කටයුතු සඳහා යොදාගත් 2012 වර්ෂයේ නිෂ්පාදිත නිල වාහන 02 න් එක් රථයක් වර්තමාන ප්‍රධාන අමාත්‍යවරයාගේ රාජකාරී කාර්යක්ෂමව ඉටුකිරීමට ප්‍රමාණවත් නොවන බවත් වෙනත් සුදුසු වාහනයක් අමාත්‍යාංශය සතුව නැති බවත් දක්වමින් රු.95,000 ක කුලියකට සුදුසු වාහනයක් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි. එකී අනුමැතිය මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් නොසලකා 2015 මාර්තු මාසයේදී මෝටර් කාර් රථයක් ලබාගෙන තිබුණු නමුත් එය 2001 වර්ෂයේ නිෂ්පාදිත recondition වාහනයක් බව නිරීක්ෂණය විය. එසේ වුවත් 2015 මාර්තු මාසයේදී උතුරු මැද පළාත් සභාව විසින් මිලට ගෙන තිබුණු 2015 වර්ෂයේ නිෂ්පාදිත තීරු බදු රහිත මිල රු.3,000,000 ක් වන මෝටර් කාර් රථයක මාසික කල්බදු වාරිකය රු.63,922 ක් වී තිබෙන තත්ත්වය තුල උක්ත සඳහන් කුලී රථය වෙනුවට මෙම පදනමින් වාහනයක් ලබා ගත්තේ නම් මාසයකට රු.31,008 ක ආර්ථික වාසියක් මෙන්ම නවීන රථයක හිමිකමද ලබාගත හැකිව තිබුණි.

(ඈ) රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ 2007 නොවැම්බර් 19 දිනැති අංක සීඑස්ඒ/පීl/40 දරන චක්‍රලේඛ ලිපියෙන් සංශෝධිත 2006 ජනවාරි 04 දිනැති සමාංක දරන අතිගරු ජනාධිපතිතුමාගේ චක්‍රලේඛ ලිපියේ 2.1 ඡේදය ප්‍රකාරව, අමාත්‍යවරයෙකු /නියෝජ්‍ය අමාත්‍යවරයෙකුගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් නිල වාහන 03 ක් පමණක් වෙන් කළ යුතු වුවත්, පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර,වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යවරයා විසින් 2015 වර්ෂය තුළ වාහන 04 ක් පාවිච්චි කර තිබුණි. ඉන් එක් වාහනයක් 2015 සැප්තැම්බර් මාසයේ සිට රු.75,000 ක මාසික කුලියකට ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.300,000 ක් කුලී වශයෙන් ගෙවා තිබුණි.

(ඉ) 2009 ජුලි 17 වන දිනැති අංක සීඒ/1/1/47 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත ප්‍රධාන අමාත්‍යවරු අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලට සහභාගීවීමේදී අනුමත ඉන්ධන සීමාවෙන් බැහැරව අතිරේක ඉන්ධන ප්‍රතිපූර්ණය සඳහා ඉඩදී ඇතත්, ඊට පටහැනිව පළාත් සමුපකාර අමාත්‍යවරයා විසින් පළාතෙන් පිටත රාජකාරී ලෙස දක්වා රු.150,200 ක් වූ ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

(ඊ) රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා වූ 2006 මාර්තු 18 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන චක්‍රලේඛ ලිපියෙන් සංශෝධිත 2006 ජනවාරි 04 දිනැති සමාංක දරන අතිගරු ජනාධිපතිතුමාගේ චක්‍රලේඛ ලිපියේ 3.4 ඡේදයෙන් ගරු අමාත්‍යවරයෙකුට සහ 3.2 ඡේදයෙන් අමාත්‍යවරයෙකුගේ සහායක කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට එක් ජංගම දුරකථනයක් බැගින් පරිහරණය කිරීමටද ඒවායේ බිල්පත් රජය විසින් නිරවුල් කිරීමට අනුමැතිය ලබා දී ඇතත් පළාත් ප්‍රවාහන හා සමූපකාර අමාත්‍යවරයා හා ඔහුගේ පෞද්ගලික ලේකම්වරයා විසින් එකී සීමාව ඉක්මවා තවත් එක් ජංගම දුරකථනයක් බැගින් භාවිතා කර තිබුණු අතර ඒවායේ බිල්පත්ද අමාත්‍යාංශ වැය ශීර්ෂයෙන් නිරවුල් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එකී අමතර ජංගම දුරකථන වෙනුවෙන් නිරවුල් කර තිබුණු බිල්පත් වටිනාකම අමාත්‍යවරයා වෙනුවෙන් රු.61,857 ක් ද, ඔහුගේ පෞද්ගලික ලේකම්වරයා වෙනුවෙන් රු.68,713 ක්ද වූ අතර අමාත්‍යවරයා වෙනුවෙන් බිල්පත් නිරවුල් කර තිබුණු ජංගම දුරකථන 02 න් අමාත්‍යවරයාගේ නමින් වූයේ එක් දුරකථනයක් පමණි. පෞද්ගලික ලේකම්වරයා වෙනුවෙන් බිල්පත් නිරවුල් කර තිබුණු ජංගම දුරකථන 02 කම අමාත්‍යවරයාගේ නමින් ලියාපදිංචි කර තිබුණු බව නිරීක්ෂණය විය.

## 6.7 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභාවේ සියළුම වත්කම්වල භාරකාරත්වය පැවරී ඇති ප්‍රධාන ලේකම් විසින් උතුරු මැද පළාත් සභාවේ සියළුම ආයතන වෙත ඇති නිල නිවාසවල භාරකාරත්වය පවරා ගෙන ඒවාට අදාල අත්‍යාවශ්‍ය තොරතුරු ලේඛනගත කර නොතිබුණු අතර එම නිසා නිවාසලාභීන් තෝරා ගැනීම, කුලී අයකිරීම යනාදිය ප්‍රධාන ලේකම්වරයාගේ පාලනයෙන් තොරව ඒ ඒ ආයතන මට්ටමින් සිදුවන බව නිරීක්ෂණය විය. එම නිසා නිවාසලාභීන් තෝරා ගැනීම, ගිවිසුම් අත්සන් කිරීම, නිවාස වලින් ඉවත්වීම, කුලී අයවීම් යනාදී අවස්ථාවන්හිදී අවිධිමත් හා අනුචිත ක්‍රියාකාරකම් සිදුවී ඇති බවද නිරීක්ෂණය විය.

(ආ) දැනට ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් කටයුතු කරන නිල නිවාස 33 න් නිල නිවාස 14 ක අයිතිය අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් සතුව පවතින නමුත් එකී නිල නිවාස ප්‍රධාන ලේකම් වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ඉතිරි නිල නිවාස 19 යෙහිද අයිතිය සනාථ කරගත හැකි ලියවිලි ප්‍රධාන ලේකම් සතුව නොතිබුණු අතර එම නිල නිවාස ප්‍රධාන ලේකම් කාර්යාලයේ වත්කමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) අංක 2011/12/01/04 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාට සහ සාමාන්‍යාධිකාරිවරයාට හැර සෙසු නිලධාරීන්ට වාහන වෙන්කර දීම යෝග්‍ය නොවන බව සහ නීත්‍යානුකූල නොවන බවද සාමාන්‍යාධිකාරිවරයාට හා සභාපතිවරයාට වෙන්කල වාහන හැර සෙසු සියළු වාහන ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තැබිය යුතු බවද දක්වා තිබියදී ඊට පටහැනිව අධිකාරියට අනුයුක්ත කර සිටින පරිපාලන නිලධාරී හා විධායක ඉංජිනේරුවන් විසින් අධිකාරියේ වාහන රාත්‍රී කාලයේදී තම නවාතැන්වල ගාල් කර තබන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) අනුරාධපුර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 04 ක ඍජු ඉගෙනුම් කාර්යය සඳහා ලබා දී තිබුණු පරිගණක යන්ත්‍ර 08 ක් සහ උපාංග 2013 වර්ෂයේ සිට අනුරාධපුර කලාප අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල කටයුතු සඳහා යොදවා ගනිමින් තිබෙන තත්ත්වය තුල එම සම්පත් අරමුණුගත තත්ත්වයෙන් බැහැරව ගොස් අවභාවිත තත්ත්වයකට පත්ව තිබුණි.

6.8 ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------

දකුණු පළාතේ ඓතිහාසික, සංස්කෘතික, සමාජීය ජන ජීවිතය හා ආර්ථිකය සම්බන්ධ තොරතුරු හා ඡායාරූප ඇතුලත් කරමින් දකුණු පළාත් සභාව වෙනුවෙන් සම්පාදනය කර තිබුණු ග්‍රන්ථයක් රු.12,000 ක් ගෙවා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මිලට ගෙන තිබුණු නමුත් එය මිලට ගැනීමේ අවශ්‍යතාවය අනාවරණය නොවීය. එසේම මෙම ග්‍රන්ථය අනෙකුත් සියළුම පළාත් අමාත්‍යාංශ ඇතුළු ප්‍රධාන ආයතන විසින්ද මිලට ගෙන තිබුණු බව අනාවරණය විය.

6.9 හඳුනාගන්නා ලද පාඩු

-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රධාන ලේකම් කාර්යාලයට අදාල රු.11,377,390 ක් වූ විදුලි බිල්පත් 13 ක් නියමිත දිනයට පෙර නොගෙවීම හේතුවෙන් ලංකා විදුලි බල මණ්ඩලය වෙත රු.106,946 ක අධිභාරයක් සමාලෝචිත වර්ෂයේදී ගෙවීමට සිදුව තිබුණි.

(ආ) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේදී ආනයනික බඩ ඉරිගු බීජ කිලෝග්‍රෑම් 15000 ක් මිලට ගැනීමට රු.13,350,000 ගෙවා තිබීමට අදාලව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් බඩ ඉරිඟු බීජ කිලෝ ග්‍රෑම් 5000 ක් මිලට ගැනීමට සැපයුම්කරුවන් තෝරා ගැනීම සඳහා පළකළ පුවත්පත් දැන්වීමෙහි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.6 ට අනුකූල නොවන ලෙස **"ආනයනික බඩ ඉරිඟු බීජ"** සඳහා මිල ගණන් කැඳවන බව දක්වා තිබීමෙන් දේශීය බීජ නිෂ්පාදකයින් අධෛර්යමත් කර තිබුණි. එසේම අවම මිල ගණන් ප්‍රතික්ෂේප කර ගොවීන් ඉල්ලා සිටින බීජ ප්‍රභේදය වැඩි මිල ගණන් මත මිලට ගැනීම නිසා පළාත් සභාවට රු.112,500 ක මූල්‍ය අලාභයක් වී තිබුණි. ගොවීන් වැඩි මිල සහිත බීජ ඉල්ලා සිටින්නේ නම් මෙම මුදල එම ගොවීන්ගේ ප්‍රතිලාභී දායකත්වයෙන් ආවරණය කර ගත යුතුව තිබුණි.

(ii) මධ්‍යම රජයේ අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රථමයෙන් මිලට ගත් ප්‍රමාණයෙන් අඩකට අඩු ප්‍රමාණයක් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මිලට ගත හැකි නමුත් අමාත්‍යාංශය විසින් ප්‍රථමයෙන් මිලට ගෙන තිබුණු ආනයනික බඩඉරිඟු බීජ කිලෝ ග්‍රෑම් 5000 මෙන් දෙගුණයක් එනම් කිලෝ ග්‍රෑම් 10000 ක් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මිලට ගැනීමට පළාත් අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබුණි.

6.10 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මහ නගර සභා මාර්ගයක් වූ පණ්ඩුකාභයපුර මලියදේව මාවත සඳහා සම්මත සනකමට වඩා වැඩියෙන් Asphalt යෙදීමත්, ABC මගින් පිරවීමට හැකිව තිබුණු කොටස් පිරවීම සඳහා Asphalt යෙදීමත් නිසා රු.805,040 ක් ද, ප්‍රවාහනය කල Asphalt ප්‍රමාණය වැඩියෙන් දැක්වීම හේතුවෙන් රු.954,975 ක්ද, වශයෙන් රු.1,760,015 ක් Asphalt සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) පළාත් මූල්‍ය රීති 422.2 ප්‍රකාරව වෙළඳ පොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර උතුරු මැද පළාත් සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල සැඳහුම් කැඳවා තෝරාගත් සැපයුම්කරුවන් වෙත ප්‍රධාන අමාත්‍යාංශය විසින් කොන්ත්‍රාත් 115 ක් ප්‍රදානය කර ඇති බව ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන ලේඛනයේ දක්වා ඇත. එසේ වුවද එකී ලේඛනය සහ කොන්ත්‍රාත් ගොනු පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) උතුරු මැද පළාත් සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල සැඳහුම් කැඳවා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගත්තේ නම් ලියාපදිංචි සෑම කොන්ත්‍රාත්කරුවකුටම සමාන අවස්ථා ලබාදීම සඳහා උතුරු මැද පළාත් සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවේ පළමු කොන්ත්‍රාත්කරුගේ සිට අවසාන කොන්ත්‍රාත්කරු දක්වා මිල ගණන් ලබා ගැනීමට උචිත ක්‍රමවේදයක් අනුගමනය කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) 2015 වර්ෂයේදී ප්‍රදානය කර තිබුණු කොන්ත්‍රාත් 115 කින් විගණනයට ඉදිරිපත් කල කොන්ත්‍රාත් 80 කට අදාල ගොනු පරීක්ෂාවේදී පළාත් සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 169 දෙනා අතරින් කොන්ත්‍රාත්කරුවන් 41 දෙනෙකුගෙන් 05-14 අතර අවස්ථා ගණනකදී මිල සැඳහුම් කැඳවා තිබුණු අතර කොන්ත්‍රාත්කරුවන් 68 දෙනෙකුගෙන් එක් අවස්ථාවකදී හෝ මිල සැඳහුම් ලබාගෙන නොතිබුණි.

(iii) එසේම උතුරු මැද පළාත් සභාවේ ලියාපදිංචි වී නොසිටි කොන්ත්‍රාත්කරුවන් 09 දෙනෙකු වෙත ගිවිසුම්ගත වටිනාකම රු.38,402,027 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 17 ක් ප්‍රදානය කර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිමකර, ගිවිසුම්වලට එළැඹීමට පෙර පළාත් සභා සංකීර්ණ පරිශ්‍රයේ නීත්‍යානුකූල අවසරයකින් තොරව ඇස්තමේන්තු වටිනාකම රු.3,289,580 ක් වූ වාහන ගරාජයක් 2015 මාර්තු 20 දින වන විට ඉදිකරමින් පැවති නමුත් ඊට අදාල කොන්ත්‍රාත් ගොනුව 2016 ජූලි 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරුණි.

## 6.11 කාර්ය මණ්ඩල පරිපාලනය

### 6.11.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු ආයතන

| | | අනුමත | තථ්‍ය | අතිරික්ත | (ඌණතාවය) |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ | 749 | 715 | - | (34) |
| (ii) | තෘතීයික | 248 | 137 | - | (111) |
| (iii) | ද්වීතියික | 4207 | 2997 | - | (1210) |
| (iv) | ප්‍රාථමික | 3008 | 2571 | - | (437) |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික) | 11 | 05 | - | (06) |
| | | 8223 | 6425 | | (1798) |

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු 153 ක් වූ කාර්යය මණ්ඩලය ඉක්මවා තත්කාර්යය පදනම මත බඳවා ගෙන තිබුණු කම්කරු සහ කළමනාකරණ සහකාර නිලධාරීන් 111 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී රු.28,136,783 ක වැටුප්, මාර්ග නඩත්තු වැය විෂයයට හරකර ගෙවා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ කටයුතු යාවත්කාලීන කිරීම වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේදී අනුමත කර තිබුණු ගණකාධිකාරී තනතුර සහ 2015 වර්ෂයේ ජූනි මාසයේදී අනුමත කර තිබුණු අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරු 23 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. එම නිසා පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වන උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල වැරදි සහ වංචා වැළැක්වීම සඳහාත්, වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත් හඳුන්වාදී ඇති පද්ධති හා පාලන ක්‍රමවල දුර්වලතා හඳුනාගෙන එම දුර්වලතා මග හරවා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග ඉහල කළමනාකරණයට වාර්තා කිරීමට හැකිවන ලෙස විගණන කාර්යයන් සංවර්ධනය, විමර්ශන කටයුතු ඵලදායිතා වර්ධනය, ආයතනික ධාරිතා සංවර්ධනය සහ යහ පාලන කටයුතු සංවර්ධනය කිරීමට බාධාවක් වී ඇත.

(ඇ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ තනතුරු 05 ක් සඳහා පුද්ගලයන් 86 දෙනෙකු හා පාසල්වල අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ තනතුරු 06 ක් සඳහා පුද්ගලයින් 35 දෙනෙකු සේවයේ නිරත වී සිටින අතර කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා අතිරික්ත නිලධාරීන් 03 දෙනෙක් සේවයේ නිරතව සිටියදී කාර්යාල කාර්ය සහායකයින්ට 2015 වර්ෂෙය් දී රු. 296,375 ක මුදලක් අතිකාල දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඈ) එක් පරිපාලන නිලධාරී තනතුරක් පමණක් අනුමත සේවක සංඛ්‍යාව තුළ ඇති නමුත් ප්‍රධාන අමාත්‍යාංශයේ තථ්‍ය සේවක සංඛ්‍යාව තුල පරිපාලන නිලධාරීන් දෙදෙනෙකු සිටින අතර ඉන් එක් අයෙකු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්ත කර තිබුණි. 2012 දෙසැම්බර් 05 සිට 2016 ජූනි 30 දක්වා කාලපරිච්ඡේදය සඳහා එකී නිලධාරියා වෙත වැටුප් හා දීමනා වශයෙන් රු.1,634,315 ක් ගෙවා තිබුණු නමුත් එම මුදල් අදාල අධිකාරියෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

6.11.2 පාසල් කාර්යය මණ්ඩලය

| | | අනුමත | තථ්‍ය | අතිරික්ත | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | විදුහල්පති | 1017 | 732 | - | 285 |
| (ii) | ගුරුභවතුන් | 15981 | 15456 | - | 525 |
| (iii) | ගුරු සහායක | - | 55 | 55 | - |
| (iv) | සැලසුම් හා මූල්‍ය සහකාර/ සංවර්ධන සහකාර/ වැඩසටහන් සහකාර/ කළමනාකරණ සහකාර/විද්‍යාගාර සහායක/ නේවාසිකාගාර පාලක | 936 | 107 | - | 829 |
| (v) | සුළු සේවක | 1317 | 1364 | 47 | - |
| (vi) | වෙනත් | - | 05 | 05 | - |
| | | 19251 | 17719 | 107 | 1639 |

(අ) ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කලාපයේ පාසල්වල ගුරුභවතුන් 07 දෙනෙකු 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල වෙනත් ආයතනවල රාජකාරී කටයුතු සඳහා මුදාහැර තිබුණි.එමෙන්ම මෙම ගුරුභවතුන්ට 2015 වර්ෂයේ දී රු.2,707,408 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණු නමුත් එම වැටුප් හා දීමනා එකී ගුරුභවතුන් අනුයුක්ත කර තිබුණු ආයතනවලින් ප්‍රතිපූර්ණය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) උතුරු මැද පළාතේ 805 ක් වූ පාසල් තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් 1050 ක් සහ 828 දෙනෙකුගේ ඌණතාවයක් පැවතුණි. එකී ඌණතාවය පාසල්වල ඉගෙනුම් සහ ඉගැන්වීම් කටයුතුවල අපේක්ෂිත මට්ටමට ලඟා වීමට බාධාවක් වී ඇති අතර 2016 මාර්තු 31 දින වන විට, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඇතැම් තනතුරුවල 110 දෙනෙකුගේ අතිරික්ත කාර්ය මණ්ඩලයක් පැවතුණි. එකී අතිරික්ත කාර්ය මණ්ඩලය වෙත මාසිකව ගෙවනු ලබන වැටුප් අනාර්ථික ගනුදෙනුවක් බවට පත්ව තිබුණි.

6.11.3 රෝහල් කාර්යය මණ්ඩලය
--------------------------------

| | | අනුමත | තථ්‍ය | අතිරික්තය | ඌණතාවය |
|---|---|---|---|---|---|
| (i) | විශේෂඥ වෛද්‍ය නිලධාරී | 21 | 17 | - | 04 |
| (ii) | ශ්‍රේණි වෛද්‍ය නිලධාරී | 356 | 365 | 09 | - |
| (iii) | අනෙකුත් වෛද්‍ය නිලධාරී | 85 | 89 | 4 | - |
| (iv) | හෙද නිලධාරී (රෝහල්) | 590 | 589 | - | 1 |
| (v) | හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) | 31 | 13 | - | 18 |
| (vi) | මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් | 1100 | 812 | - | 288 |
| | තාක්ෂණ/එන්නත්කරු/වාට්ටු ලිපිකරු/ආහාර භාරකරු හා වෙනත් | 177 | 111 | - | 66 |
| (vii) | කම්කරු (සාමාන්‍ය) | 363 | 221 | - | 142 |
| (viii) | කම්කරු (සනීපාරක්ෂක) | 394 | 694 | 300 | - |
| (ix) | උපස්ථායක | 444 | 403 | - | 41 |
| | | 3561 | 3314 | 313 | 560 |

6.12 වාහන උපයෝජනය
-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දෛනික ධාවන සටහන් සම්පූර්ණ කිරීමේදී පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීන් සහ රියදුරන් දුස්සන්ධානයෙන් යුතුව (වංචා කිරීම සඳහා සාමූහිකව කටයුතු කිරීම) කටයුතු කරමින් ගමන් විස්තර, එක් එක් ගමනේ දුර, පැමිණි හා පිටවූ වේලාවන් සඳහා සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර රියදුරන් විසින් ධාවන සටහන් පිළියෙල කර ඇති බවත්, අදාල නිලධාරීන් විසින් ඒවා අත්සන් කර ඇති බවත් අනාවරණය විය.

(ආ) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධානවලින් ඇතිකර ගැනීමට ප්‍රතිපාදන සැලසී නොතිබුණු විපක්ෂ නායක තනතුරට පත්කර සිටි උතුරු මැද පළාත් සභා මන්ත්‍රීවරයෙකුට තාවකාලික පරිහරණයට වෙළඳපල වටිනාකම රු.7,100,000 ක් වූ ඩබල් කැබ් රථයක් උතුරු මැද පළාත් ප්‍රධාන

ලේකම්වරයා විසින් ලබා දී තිබුණි. එකී වාහනය 2015 ජූලි 01 දින පිටස්තර පුද්ගලයෙකු විසින් ධාවනය කරමින් සිටින විට අනතුරට ලක්වී ඇති නමුත් අනතුර සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා ප්‍රධාන ලේකම් විසින් විමර්ශන නිලධාරියකු පත්කර තිබුණේ අනතුර සිදුවී මාස 06 ක් ඉකුත්වීමට ආසන්න 2015 දෙසැම්බර් 26 දිනදී වූ අතර එකී විමර්ශන වාර්තාව 2016 මාර්තු 14 දින ලබාදී තිබුණු නමුත් අනතුරට වගකිව යුත්තන් හා අලාභයේ ප්‍රමාණය හඳුනා නොගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ද නොසලකා අළුත්වැඩියා කිරීම සඳහා 2015 දෙසැම්බර් 31 දින පෞද්ගලික ගරාජයකට භාර දී තිබුණි. 2016 ජූලි 30 දින වන විටද එකී වාහනය ආපසු භාරගෙන නොතිබුණි.

6.13 බැංකු සැසඳුම්

-----------------

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, බැංකු ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ගෙවීම් රු.2,407,670 ක් වූ අතර 2016 මැයි මස වන විට එම වටිනාකම රු.2,384,370 ක් වී තිබුණි.

7. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

7.1 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) හා 2010 මාර්තු 10 දිනැති චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව පළාත් සභාව සහ එහි එක් එක් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව සහ ආයතනය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබුණි.

7.2 අභ්‍යන්තර විගණනය

-------------------------

පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල වැරදි හා වංචා වැලැක්වීම සඳහාත්, වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, හඳුන්වා දී ඇති පද්ධති හා පාලන ක්‍රමවල දුර්වලතාවයන් හඳුනාගෙන එකී දුර්වලතාවයන් සහ ඒවා මඟහරවා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග ඉහළ කළමනාකරණයට වාර්තා කිරීම පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වන අතර එක් එක් වර්ෂවල විගණන හා විමර්ශන කාර්යය භාරයන් පැවරීමේදී පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරී ඇතුළු සියළුම ආයතනවල අභ්‍යන්තර පාලනයන්හි ප්‍රධාන අඩුපාඩු හඳුනාගත හැකිවන ලෙස එය සිදුකල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් අනුව ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක කල යුතු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරී ඇතුළු ආයතන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

7.3 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඊ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු යටත් පිරිසෙයින් කාර්තුවකට එක් වරක් හෝ පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාවේ එක් එක් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන විසින් එකී කමිටු පවත්වා නොතිබුණි.

7.4 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන විසින් 2015 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

8. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

| | ප්‍රධාන ක්ෂේත්‍ර | නිරීක්ෂණයන් |
|---|---|---|
| | -------------------- | ------------------- |
| (අ) | ගිණුම්කරණය | ප්‍රමාණවත් ගිණුම්කරණ ක්‍රම හඳුන්වා දී නොතිබීම |
| (ආ) | ආදායම් පරිපාලනය | විධිමත් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත්වලට අදාල ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකිරීම |
| (ඈ) | ස්ථාවර වත්කම් | ස්ථාවර වත්කම් ලේඛනයේ සියළුම වත්කම් ඇතුලත් කර නොතිබීම |
| (ඉ) | මානව සම්පත් කළමනාකරණය | බඳවා ගැනීමේ පරිපාටි මාර්ගෝපදේශයන්ට පටහැනිව පිළියෙල කර තිබීම හා අනුමත සේවක සංඛ්‍යාව බඳවා ගෙන නොතිබීම |
| (ඊ) | ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම | සැලසුම්කල ව්‍යාපෘති ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කර නොතිබීම |
| (උ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකිරීම |
| (ඌ) | ගබඩා පාලනය | තොග පොත් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබීම |
| (එ) | පැමිණීම හා අතිකාල පාලනය | ඇඟිලි සලකුණු කිරීමේ යන්ත්‍ර නිසි අධික්ෂණයකට ලක්කර නොතිබීම |